1544



17 MAY 2018

## ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව
## ගල්ඔය දකුණු ඉවුර- දමන ව්‍යාපාරය

රැස්වීම පැවැත් වූ ස්ථානය- නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය දමන

රැස්වීම පැවැත් වූ දිනය හා වේලාව- 2018. 02. 22

රැස්වීමේ ප්‍රධානත්වය- නේවාසික ව්‍යාපෘති කළමණාකරු

සහභාගිත්වය

**රජයේ නිළධාරි මහතුන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථානය |
|---|---|---|---|
| 01 | එස් එල් ඒ අන්සාර් මහතා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු | දමන |
| 02 | අයි එම් ටී එම් බණ්ඩාර මහතා | වාරිමාර්ග ඉංජි. සහකාර | දමන |
| 03 | ඉන්දික නාරායන මහතා | වගා කළමනාකරු | හිඟුරාණ |
| 04 | යූ පී ආර් ඩී උයන්වත්ත මිය | ජනපද නිළධාරි | එරගම |
| 05 | පී ඩී අයි රම්‍යලතා මිය | සංවර්ධන සහකාර | දමන |
| 06 | ඒ බසීර් මහතා | සංවර්ධන නිළධාරි | දමන |
| 07 | ඒ කාබූදීන් මහතා | සංවර්ධන නිළධාරි | දමන |

**ගොවි නියෝජිත මහතුන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථානය |
|---|---|---|---|
| 01 | ආර් කේ බී එම් සමන්ත මහතා | සභාපති | තිස්ස ගොවි සංවිධානය |
| 02 | කරුණාරත්න ගනේගෙදර මහතා | ලේකම් | තිස්ස ගොවි සංවිධානය |
| 03 | ආර් එම් පියතිලක මහතා | සභාපති | ලක්මිණි ගොවි සංවිධානය |
| 04 | ඩී එම් තිලකරත්න මහතා | සභාපති | කිණවත්ත ගොවි සංවිධානය |
| 05 | යූ එල් සුලෙයිමා ලෙබ්බේ මහතා | සභාපති | පෙරුවලිකණ්ඩම් ගොවි සංවිධානය |
| 06 | ඒ එම් එස් ඉබ්‍රාහිම් මහතා | සභාපති | එරගම ගොවි සංවිධානය |
| 07 | ඒ එම් පුංචි මැණිකේ මිය | ලේකම් | ලක්මිණි ගොවි සංවිධානය |
| 08 | ඩී එම් කරුණාදාස මහතා | සභාපති | පැරකුම් ගොවි සංවිධානය |
| 09 | යූ පී විජේසිංහ මහතා | සභාපති | ගැමුණු ගොවි සංවිධානය |
| 10 | ඩබ් පී කැලුම් ප්‍රියන්ත මහතා | භාන්ඩාගාරික | ගැමුණු ගොවි සංවිධානය |
| 11 | ඩබ් ආර් ජයතිලක මහතා | ලේකම් | පැරකුම් ගොවි සංවිධානය |
| 12 | ඒ එල් මොහිදීන් මහතා | භාණ්ඩාගාරික | වික්ලාමඩුව ගොවි සංවිධානය |
| 13 | ඩී එම් විරසිංහ මහතා | ලේකම් | නාරංගහපල්ලම ගොවි සංවිධානය |
| 14 | ඒ එල් කේ ලෙබ්බේ මහතා | ලේකම් | වික්ලාමඩුව ගොවි සංවිධානය |
| 15 | ඒ පී කිර්තිරත්න මහතා | ලේකම් | මිගහපල්ලම ගොවි සංවිධානය |
| 16 | කේ එල් කලිල් මහතා | ලේකම් | පල්ලපත්තුව ගොවි සංවිධානය |
| 17 | එස් පී හමීඩ් මහතා | නියෝජිත | පල්ලපත්තු ගොවි සංවිධානය |
| 18 | ඩී එම් අබේගුණවර්ධන මහතා | සභාපති | කරලැව ගොවි සංවිධානය |
| 19 | ආර් වයි එම් හින්බණ්ඩා මහතා | ලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 20 | කේ ඥාණසිරි මහතා | සභාපති | මහසෙන් ගොවි සංවිධානය |

### පිළිගැණිම හා අරමුණ පැහැදිලි කිරිම - එස් එල් ඒ අන්සාර් නේවාසික ව්‍යාපෘති කළමනාකරු දමන

2018 පෙබරවාරි මාසයට නියමිත ව්‍යාපාර කමිටු රැස්විම සාර්ථක කර ගැනිම සඳහා පැමිනි වාරිමාර්ග ඉංජිනේරු සහකාරතුමන් ගල්ඔය වැවිලි සමාගමේ වගා කළමනාකාරතුමන් එරගම ප්‍රා දෙශිය ලේකම් කාර්යාලයේ ජනපද නිළධාරිතුමිය ඇතුලු සියලුම නිළධාරි මහත්ම/මහත්මීනුත් ගොවි සංවිධාන නියෝජනය කරමින් පැමිණි සියලුම නිළධාරි හා නියෝජිත මහත්ම/මහත්මීනුත් මා ඉතා ගෞරවයෙන් යුතුව පිලිගනු ලබනවා·

අද දින රැස්විමේ මුලික අරමුණ ඉදිරි කන්න කෙසේ කරගන්නේ දැයි කල යුතු සාකච්ජාවත් පවතින කන්නය වෙනුවෙන් තව දුරටත් ජලයේ අවශ්‍යතාවයන් ඇත්දැයි හඳුනා ගැනිමත් ආදි කරුණුයි ඒ අනුව රැස්විමේ කටයුතු න්‍යාය පත්‍රයට අනුව සිදු කිරිම වැදගත්·

### ආයතන සංවර්ධන කටයුතු - එස් එල් ඒ අන්සාර් නේවාසික ව්‍යාපෘති කළමණාකරු දමන

මෙම වර්ෂයේ නිළවරණ 10 ක් පැවැත්විමට යෙදි ඇති අතර එම ගොවි සංවිධාන කල් වේලා ඇතිව සුදානම් වන ලෙසත් ස්ථිර හා තාවකාලික සාමාජික නාම ලේඛණය යාවත් කාලින කරන ලෙස මා දැනුම් දි ඇති අතර එය කඩිනමින් සිදු කර කාර්යාලයට ලැබීමට සලස්වන ලෙසත් දැනුම් දිමට කැමතියි·

ගොවින් නියෝජනය කරමින් මෙම රැස්විම් වලට පැමිනෙන ඔබතුමන්ලා මෙහිදි ගනු ලබන තිරණ සියල්ල ගොවින් වෙත දැනුම් දිම වැදගත් ඒ අනුව සියලු ගොවි සංවිධාන මහ සභා කැඳවා ගනු ලබන තිරණ පිලිබඳව දැනුවත් කරන්න

| | | | | |
|---|---|---|---|---|
| වාරිමාර්ග ඉංජිනේරු සහකාර අයි එම් ටී එම් බණ්ඩාර මහතා | මේ වන විට සේනානායක සමුද්‍රයේ ජල ධාරිතාවය අක්කරඅඩි94900 ක් හා උසින් 52 ක් ලෙස සටහන් වේ" එරගම ප්‍රදේශයට ජලය ලබා දීම අවසන් කර ඇති අතර ඉහළ කොටසේ ගොවීන්ගේ ඉල්ලීම පරිදි තවත් එක් ජල මුරයක් ලබා දීමට කටයුතු යොදා ඇත ඉදිරි කන්නය ආරම්භ කිරීම සදහා අක්කර අඩි 45000 ක් අවශ්‍ය වන අතර වැසි අපේක්ෂාවෙන් සිටින අතර පවතින ජල ප්‍රමාණය වගා කර ඇති උක් වගාවට ලබා දිය යුතුයි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෝරාගෙන ඇති ඇ පද්ධතියේ වැඩ ඉදිරි සතිය තුල ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා සියලු යෝජනා ක්‍රියාත්මක කල නොහැකි වන අතර මීට වසර 6 කට පමණ පෙර කල ඉල්ලීම් වලට අනුවයි මෙම සංවර්ධන කටයුතු සිදු කරන්නේ | | | |
| ඩබ් ආර් ජයතිලක මහතා පැරකුම් ගොවි සංවිධානයේ ගරු ලේකම් | ආර් බ 6 ඇලේ බන්ට් එක කඩාගෙන යාම | එන වසරේ ව්‍යාපෘති යෝජනා සදහා එය ඉදිරිපත් කර ඇති අතර දැනට සකස් කර ගැනීමට බැකෝ යන්ත්‍රයක් ලබා දීමට එකග විය | වාමා දෙ | අස්වනු නෙලිමෙන් අනතුරුව |
| පුලෙයිමා ලෙබ්බේ මහතා පෙරුවලිකන්ඩම් ගොවි සංවිධානයේ ගරු සභාපති | 24 බ්ලොක් එක අසලින් කඩාගෙන යාම | සිනි සමාලම විසින් පරික්ෂා කර බැලීමට එකග විය | ගල්ඔය වැවිලි සමාගම | ඉදිරි සතිය ඇතුලත |
| ආර්එම් බී කේ සමන්ත රාජපක්ෂ මහතා තිස්ස ගොවි සංවිධානයේ ගරු සභාපති | ප්‍රධාන ඇලෙන් දමා ඇති බෝක්කු විනාශ වී තිබීම විශාල ගස් වල අතු ප්‍රධාන ඇලටපහත්ව තිබීම | කෘෂිකර්ම කම්වුවේදි සයිබන්ට් එකේ කුඹුක් ගස් හා ගිණිපෙට්ටි පාලම අදල කුඹුක් ගස් ඉවත් කිරීමටත් අතු ඉවත් කිරීමට අවසර ඉල්ලීමට එකග විය | වා මා දෙ | |
| ආර් වයි එම් විඡේබණ්ඩා මහතා රුහුණු ගොවි සංවිධානයේ ගරු ලේකම් | ආර් බී 4 (11) කෙත් ඇල ගොවීන් අල්ලා ගැනිම පාර අවහිර කිරීම | රක්ෂිතය වෙන් කර ගල්දමා වෙන්කර ගන්නා ලෙසත් පසුව ජේ සි බී යන්ත්‍රයක් මගින් පාර සකස් කර ගන්නා ලෙසත් දැනුම් දෙන ලදි | වා මා දෙ | |
| පී කිර්තිරත්න මහතා | මීගහකුදුර අමුණ ගොඩ දැමීම අතරමග නැවතීම | කුඹුක් ගස් ඉවත් කර ගැනීමේ ගැටලුව නිසා ප්‍රමාද වු බවත් ඒවා ඉවත් කර එය ගොඩ දමා දීමටත් එකග විය | වා මා දෙ | |
| ක් ගනේගෙර මහතා තිස්ස ගොවි සංවිධානයේ ගරු ලේකම් | 2018 යල කන්නය ආරම්භය ගැටලුවක් පැහැදිලි සැලැස්මක් අවශ්‍යයි | ඒ පිලිබදව සාකච්ජා කර සැලසුමක් සකස් කරන අතර ඉදිරියේ දි ගොවීන්ගේ දැන ගැනිම සදහා ඉදිරිපත් කරාවි | වා මා දෙ | |
| න්දික නාරායන මහතා වැවිලි කළමනාකරු ගල්ඔය වැවිලි සමාගම | දැනට පවතින වගාවට ජලය ලබා ගැනිම සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග කතා කර ඇති අතර ඒ සදහා එකගවී තිබේ මැයි මාසයේ දි අස්වනු නෙල්මේ කටයුතු ආරම්භ කිරීමට නියමිතයි | | ගල්ඔය වැවිලි සමාගම | |
| ලෙයිමා ලෙබ්බේ මහතා පෙරුවලිකණ්ඩම් ගොවි සංවිධානයේ ගරු සභාපති | 24 26 බ්ලොත් වලට ජලය ලබා ගැනිමේ ගැටලු පැවතිම | ඒ පිලිබදව සොයා බැලිමට එකගවිය | ගල්ඔය වැවිලි සමාගම | |
| පී කීර්තිරත්න මහතා මිගහපල්ලම ගොවි සංවිධානයේ ගරු ලේකම් | උක් ඇඹරිමේදි පිටවන කළු දුම හා කළු අපද්‍රව්‍ය නිසා පරිසරයට හානිසිදු වීම | ඒ පිලිබදව පරික්ෂා කර ඒවා වැලැක්වීමට පියවර ගෙන ඇත | ගල්ඔය වැවිලි සමාගම | |
| ආර් වයි එම් විජේබණ්ඩා මහතා රුහුණු ගොවි සංවිධානයේ ගරු ලේකම් | උක් ප්‍රවාහනය කරන මාර්ගය අබලන්වීම | සකස් කිරීමට ආරම්භ කර ඇති බැවින් ගොවීන් මැදිහත් වි අවශ්‍ය ආකාරයට සකස් කර ගැනිමට කටයුතු කරන්න | ගල්ඔය වැවිලි සමාගම | |

සාකච්ජා කිරිම සදහා වෙනත් කාරණා නොමැති බැවින් පැමිණි සියලු දෙනාට ස්තුතිය පිරිනමමින් නේවාසික ව්‍යාපෘති කළමනාකාර මහතා විසින් රැස්වීමේ කටයුතු පෑව 1 :30 ට පමණ අවසන් කරන ලදි.

ස් ඒල් ඒ අන්සාර්
නේවාසික ව්‍යාපෘති කළමනාකරු
දමනා

S.L.A. Ansaar
Resident Project Manager(Act.)
Gal-oya Right Bank
Damana.